සැ. යු.- 2010.01.22 දින පළ වූ අංක 1,638 දරන ගැසට් පත්‍රයේ I- III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,639 - 2010 ජනවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2010.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 542 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 පෙබරවාරි මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් සභා නිවේදන

## දකුණු පළාත් සභාව

### දකුණු පළාතේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය 2(1) වගන්තිය යටතේ නියෝගය

දකුණු පළාතේ, පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 2(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් අමාත්‍ය ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම, පහත සඳහන් නියෝග 2010 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කරමි.

ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 23 වැනි දින,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
ගාල්ලේ දී ය.

### නියෝග

මෙම නියෝග දකුණු පළාතේ පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 2(1) හා (2) සඳහා වූ නියෝග - (තෑගි තරග මත බදු පැනවීම) යනුවෙන් හඳුන්වනු ලැබේ.

(I) දකුණු පළාත තුළ පවත්වනු ලබන සෑම තෑගි තරගයකදීම පිරිනමනු ලබන ත්‍යාගවල මුළු වෙළඳ වටිනාකම මත මෙහි පහත සඳහන් ආකාරයෙන් ගණනය කරනු ලබන අනුප්‍රමාණ මත බද්දක් අයකරනු ලැබේ.

| *ත්‍යාගවල මුළු වටිනාකම* | *බදු අනු ප්‍රමාණය* |
|---|---|
| රුපියල් මිලියන විසිපහක් (මි.25) හෝ අඩු | 10% |
| රුපියල් මිලියන විසිපහකට (මි.25) හෝ වැඩි | 25% |

(II) *(අ)* බලපත්‍රය උපලේඛනයේ දක්වා ඇති (ආ) ආකෘතියට අනුව විය යුතුය.

*(ආ)* බලපත්‍රය සඳහා වූ ඉල්ලුම්පත්‍රය උපලේඛනයේ දක්වා ඇති (අ) ආකෘතියට අනුව විය යුතු අතර රුපියල් දහසක (රු. 1,000) මුදල්වලින් ගෙවිය යුතු ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතුය. තවද තෑගි තරගයක් ප්‍රවර්ධනයට හෝ පැවැත්වීමට අදහස් කරන සෑම තැනැත්තෙකුම ඒ සඳහා මේ ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධානවල අදාළ වූ බලපත්‍රය තරගය ප්‍රසිද්ධ කිරීමට දින 14කට පෙර ලබාගත යුතුය.

*(ඇ)* පහත සඳහන් අතිකුත් ලේඛන ද ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කල යුතු වන්නේ ය. එනම් :-

(1) ඉල්ලුම්කරුගේ ලියාපදිංචි සහතිකය (ඉල්ලුම්කරු ආයතනයක් හෝ සංවිධානයක් නම්) සහ එකී සහතිකයේ සහතික පිටපතක් ;

(2) තෑගි තරගයට අදාළවන්නා වූ අවස්ථාවෝචිත පරිදි රීති හෝ කොන්දේසි ඇතුළත්, අනුමත කරන ලද ලේඛන සහ ඒවායේ සහතික පිටපත් ද සමග එකී තෑගි තරගයේ දී පිරිනමනු ලබන ත්‍යාග පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි විස්තරයක් ;

(3) බලපත්‍ර ගාස්තුව ගෙවූ බව සනාථ කිරීම සඳහා කුවිතාන්සිය.

(III) තෑගි තරග ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කරන ස්ථානය හෝ පරිශ්‍රය නිශ්චිතව ප්‍රසිද්ධ කළ යුතුය.

(IV) මෙම ප්‍රඥප්තියේ 2(2) වැනි වගන්තියේ සඳහන් වාර්තාව උපලේඛනයේ (ඇ) ආකෘතිය ප්‍රකාරව පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

මේ නියෝගවල මුදල් ප්‍රඥප්තිය යන්නෙන් දකුණු පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය හා 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය අදහස් වේ.

### *උපලේඛනය*

ආකෘතිය (අ) බලපත්‍රය සඳහා වූ ඉල්ලුම්පත්‍රය

ආකෘතිය (ආ) බලපත්‍රය

ආකෘතිය (ඇ) වාර්තාව

(අ) ආකෘතිය.

*පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (දකුණු පළාත)*

***දකුණු පළාත තුළ තෑගි තරගයක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. තෑගි තරගය පවත්වනු ලබන තැනැත්තාගේ නම :...........................
2. තෑගි තරගය පවත්වනු ලබන ස්ථානයේ ලිපිනය :...........................
3. තෑගි තරගයේ නම :...........................
4. තෑගි තරගය ප්‍රසිද්ධ කිරීම ආරම්භ කරන දිනය :...........................
5. තෑගි තරගය සංවිධානය භාර තැනැත්තාගේ නම :...........................
6. හැඳුනුම්පත් අංකය :...........................
7. තෑගි තරගය පවත්වන දිනය :...........................
8. තෑගි තරගයේ තෑගිවල සම්පූර්ණ වටිනාකම (රු.) :...........................

මා විසින් මෙහි ඉහතින් සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

අත්සන :...........................
නම :...........................
තනතුර :...........................

දිනය :...........................

*සැලකිය යුතුයි :*

බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සෑම අයදුම්පත්‍රයක් සමඟම පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය :

1. ආයතනයේ හෝ සංවිධානයේ ලියාපදිංචි සහතිකය හා එහි සහතික කළ ඡායාස්ථික පිටපතක් ;
2. තෑගි තරගයේ නීතිරීති/කොන්දේසි හා තෑගි කරනු ලබන තෑගිවල සම්පූර්ණ වටිනාකම හා විස්තර දැක්වෙන අනුමත ලේඛනය සහ සහතික කළ පිටපතක් ;

3. නියමිත බලපත්‍ර ගාස්තුව මුදලින් ගෙවූ කුවිතාන්සි පත්‍රය.

(අයදුම්පත්‍රය දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) ආකෘතිය.

*පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (දකුණු පළාත)*

**1994 අංක 02 දරන දකුණු පළාතේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 2(2) (අ) වගන්තියේ විධිවිධාන අනුව තෑගි තරග සඳහා වූ බලපත්‍රයයි**

බලපත්‍ර අංකය :...........................
නිකුත් කළ දිනය :...........................

1. තෑගි තරගයේ නම :...........................
2. තෑගි තරගය පවත්වන තැනැත්තාගේ/ආයතනයේ/සංවිධානයේ නම :...........................
3. ලිපිනය :...........................
4. ඇතුළත්වීමේ අවසාන දිනය :...........................
5. තෑගි තරගය පවත්වන දිනය :...........................
6. තෑගි තරගය පවත්වනු ලබන ස්ථානය හෝ පරිශ්‍රය :...................
7. ආයතනයේ හෝ සංවිධානයේ ලියාපදිංචි අංකය හා දිනය :..............
8. පිරිනමන තෑගිවල සම්පූර්ණ වටිනාකම (රුපියල්) :......................

මෙම බලපත්‍රය නිකුත් කරන ලද තෑගි තරගය සඳහා පමණක් වලංගු වේ.

දකුණු පළාතේ ආදායම් කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විට ඉදිරිපත් කළ යුතුය.

දිනය :...........................

.......................................
පළාත් ආදායම් කොමසාරිස්,
දකුණු පළාත.

(ඇ) ආකෘතිය.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය*

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - දකුණු පළාත

**1994 අංක 02 දරන දකුණු පළාත් සභාවේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ අංක 2 (2) වගන්තිය සමග කියැවෙන 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 10(2) වගන්තිය යටතේ නිවේදනය**

*තෑගි තරග බදු වාර්තාව*

ලිපිගොනු අංකය :...........................

බලපත්‍ර අංකය :...........................
නිකුත් කළ දිනය :.......................

මෙම වාර්තාව විධිමත් ලෙස සම්පූර්ණ කර තෑගි තරගය ප්‍රසිද්ධ කිරීමට දින 14කට පෙර ලබාගත යුතු බලපත්‍රය ලබාගැනීම සඳහා අදාළ අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

පනවනු ලබන තෑගි තරග බද්ද තරගයට ඇතුල්වීමේ අවසාන දිනය හෝ තරගය පවත්වන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනට දින 14කට පෙර පළාත් ආදායම් කොමසාරිස්ට මුදලින් හෝ බැංකු අණකරයක් මගින් ගෙවිය යුතුය.

...........................
පළාත් තක්සේරුකරු,
දකුණු පළාත.

දිනය :...........................

1. තෑගි තරගයේ නම :...........................

2. ආයතනයේ හෝ සංවිධානයේ හෝ තැනැත්තාගේ නම :...........................

3. තෑගි තරගය පවත්වන ස්ථානයේ ලිපිනය :...........................

4. තෑගි තරගයට ඇතුළත්වීමේ අවසාන දිනය :...........................

5. තෑගි තරගය පවත්වන දිනය :...........................
(මෙම දිනය වෙනස් වන්නේ නම් පළාත් ආදායම් කොමසාරිස්වරයාට ලිඛිතව දැන්විය යුතුය.)

6. පිරිනමන සමස්ත තෑගිවල එකතු වටිනාකම රුපියල් :.................

| *සමස්ත තෑගිවල එකතු වටිනාකම* | *බදු අනු ප්‍රමාණය* | *බද්ද* |
|---|---|---|
| ......................... | 10% | ......................... |
| ......................... | 25% | ......................... |

(පිරිනමන සමස්ත තෑගිවල එකතු වටිනාකම රුපියල් මිලියන 25 හෝ ඊට අඩු නම් අනු ප්‍රමාණය 10%කි. පිරිනමන තෑගිවල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 25ට වැඩි නම් අනු ප්‍රමාණය 25%කි.)

ඉහත දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර, නියමිත දිනට පෙර අදාළ බද්ද ගෙවීමට එකඟ වෙමි.

ප්‍රධාන සංවිධායකගේ අත්සන :...........................
ප්‍රධාන සංවිධායකගේ නම :...........................
පදිංචි ලිපිනය :...........................
දුරකථන අංකය :...........................
දිනය :...........................

01-762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.